---

**මහරගම නගර සභාව**

**කොළඹ දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජුලි 06 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 ජුලි 09 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මහරගම නගර සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

ගිණුම් වල දක්නට තිබූ ගිණුම් දෝෂ, වත්කම් හා වගකීම් වශයෙන් අවස්ථා හා අගයයන් යටතේ පහත වගුවෙහි දැක්වේ.

| | **ගිණුම් වලට බලපෑම** | | | |
|---|---|---|---|---|
| | **වත්කම්** | | **වගකීම්** | |
| | **අවස්ථා ගණන** | **අගය** | **අවස්ථා ගණන** | **අගය** |
| | | **රු. '000** | | **රු. '000** |
| ගිණුම්වල අඩුවෙන් දැක්වීම | 03 | 1,767 | 01 | 11,816 |

## 1.3.2. නොසැසඳෙන පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 12 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 293,981,055 ක් වූ අතර, උපයෝගී ලේඛණ / වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 257,047,932 ක් විය.

## 1.3.3 නිරවුල් නොකරන ලද ගිණුම්

ගිණුම් විෂයන් 04කට අදාලව එකතු වටිනාකම රු. 3,457,309 ක් වූ ගිණුම් ශේෂ නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් තිබෙන අතර ඉකුත් වර්ෂ වල මාගේ වාර්තා වලින් මේ පිළිබඳව පෙන්වා දී තිබුනද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

### (අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2011 ජූනි 30 දින වන විට විගණන විමසුම් 02 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල දැක්වුණු සංඛ්‍යාත්මක වටිනාකම රු.59,274,655 ක් විය.

### (ආ) තොරතුරු ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 86,659,080 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 1.3.5 අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (i) | නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරය) අංක 162 (1) (අ) වගන්තිය | 2011 ජනවාරි 12 දින වන විට දැන්වීම් පුවරු 16 කින් රු.368,800 ක මුදලක් සභාව විසින් අය කර ගෙන නොතිබුණි. |
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) | මු.රෙ. 387 | 2010 වර්ෂය මුළුල්ලේම සභාවේ නිල බැංකු ගිණුමේ අයිරා ශේෂයක් විය. |
| (ආ) | මු.රෙ. 395(ඇ) | 2008 නොවැම්බර් සිට 2010 දෙසැම්බර් දක්වා වූ බැංකු සැසඳුම් ප්‍රකාශ 2011 අගෝස්තු 05 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) | මු.රෙ. 757(2) | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 37,003,872 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,767,738 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

----------------

2.2.1 **බැංකු අයිරා පොළී**

--------------------

නගර සභා නිල බැංකු ගිණුමේ වාසිදායක ශේෂය ඉක්මවා 2005 ජූලි මස සිට 2010 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ අයිරා ලබා ගැනීම නිසා රු.2,713,169 ක බැංකු අයිරා පොළී ගෙවා තිබුණි.

2.2.2 **බැංකු සැසඳුම්**

---------------

(අ) අවසන් වරට පිළියෙල කර තිබූ 2008 ඔක්තෝබර් බැංකු සැසඳුමේ දැක්වෙන එකතුව රු. 334,200 ක් වූ තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් සඳහා සහ එකතුව රු. 7,096,087 ක් ව නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් සඳහා උපලේඛණ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) බැංකුව විසින් අඩු කර තිබූ එකතුව රු. 1,611,700 ක් වූ ගාස්තු හා හර කිරීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර එම ශේෂ පිළිබඳ උපලේඛණද ඉදිරිපත් කර නොතිබණි.

(ඇ) එකතුව රු. 337,157 ක් වූ හර ශේෂ හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) එකතුව රු. 49,679,324 ක් වූ සෘජු ලැබීම් සහ පරිසර ගිණුමට ගැලපිය යුතු රු. 49,387 ක් අදාල ගිණුම් වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

2.3 **ආදායම් පරිපාලනය**

----------------------

2.3.1 **ඇස්තමේන්තුගත, තථ්‍ය හා හිඟ ආදායම්**

------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **ආදායම් විෂයය** | **2010** ඇස්තමේන්තුගත | **2010** තථ්‍ය | **2010** දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | **2009** ඇස්තමේන්තුගත | **2009** තථ්‍ය | **2009** දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 83,300 | 66,414 | 89,465 | 71,000 | 56,272 | 74,688 |
| (ii) | බදු කුලී | 6,410 | 7,886 | 1,525 | 6,410 | 6,918 | 1,991 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 658 | 240 | 1,587 | 2,022 | 314 | 1,582 |
| (iv) | වෙනත් ආදායම් | 187,528 | 175,423 | 91,230 | 141,379 | 76,455 | 121,390 |

එකී වටිනාකම ඉදිරිපත් කරන ලද ගිණුම් සමඟ නොසැසඳෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 2.3.2 හිඟකඩ කුලී

(i) නගර සභාවට අයත් වෙළඳ සංකීර්ණ 03 ක සහ මහරගම සති පොලක කඩකාමර 23කන් 2010 දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලි රු. 427,752 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) කඩකාමර බදු දීමේ ගිවිසුමේ අංක 26 කොන්දේසිය ප්‍රකාරව බදුකරු විසින් කඩකාමර වෙනත් පාර්ශවයකට හෝ අතුරුබදු දීම සිදු නොකල යුතු වුව ද, කොට්ටාව පොදු වෙළඳ සැලේ කඩකාමර 06 ක් අතුරුබදු දී තිබුණි.

### 2.3.3 ආයෝජන පොලී

ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙහි ආයෝජනය කර ඇති රු. 5,505,190 ක් සඳහා 2006 වර්ෂයේ සිට කිසිම ලාභාංශයක් ලැබී නොතිබුණි.

## 2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පුනරාවර්තන වියදම්** | **'000** | **'000** | **'000** | **'000** | **'000** | **'000** |
| පෞද්ගලික පඩිනඩි | 98,977 | 80,302 | 18,675 | 101,153 | 75,726 | 25,427 |
| අනෙකුත් | 120,368 | 144,482 | (24,114) | 63,190 | 145,820 | (82,630) |
| උප එකතුව | 219,345 | 224,784 | (5,439) | 164,343 | 221,546 | (57,203) |
| ප්‍රාග්ධන වියදම | 156,000 | 50,054 | 105,946 | 73,965 | 85,587 | (11,622) |
| මුළු එකතුව | 375,345 | 274,838 | 100,507 | 238,308 | 307,133 | (68,825) |

## 2.5 අය වැය පාලනය

අයවැයගත ආදායම් / වියදම් හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු අවාසි සහගත විචලනයක් නිරීක්ෂණය වූයෙන් අය වැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 2.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **සේවක ශ්‍රේණිය** | **අනුමත** | **තථ්‍ය** |
|---|---|---|
| මාණ්ඩලික | 04 | 03 |
| ද්විතියික | 87 | 76 |
| ප්‍රාථමික | 238 | 184 |

සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 329 කින් පුරප්පාඩු තනතුරු 66 ක් විය.

**2.7 වත්කම් කළමණාකරණය**

---------------------------

**2.7.1 අය වීමට ඇති සේවක ණය**

---------------------------

(අ) 2010 දෙසැම්බර් 31 දිනට අය විය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂ වල එකතුව රු. 33,527,149 ක් වූ අතර, කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ස්ථාන මාරු වී ගිය සේවකයින් ගෙන් ලැබිය යුතු ණය සහ අත්තිකාරම් ශේෂ රු. 2,292,403 ක් අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා වර්ෂ කීපයක සිට ඉදිරියට ගෙන එමින් තිබුණි.

**2.7.2 ලැබිය යුතු ගිණුම්**

------------------

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු. 183,807,253 ක් වූ අතර, කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

**2.7.3 සමීක්ෂණය නොකළ වත්කම්**

-------------------------------

භෞතික පරීක්ෂණ /සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම් වල වටිනාකම රු. 141,484,022 ක් විය

**2.7.4 ගබඩා පාලනය**

----------------

ගබඩා තොගවල විදුලි භාණ්ඩ රු.1,372,380 ක තොග සම්බන්ධයෙන් ගබඩා තොග පොත් අගයන් හා ගබඩා බඩු රාක්ක පත්‍ර අනුව අගයන අතර වෙනස්කම් විය.

**2.7.5 ස්ථාවර වත්කම් ලේඛණ**

විගණනයට ඉදිරිපත් කල ස්ථාවර වත්කම් ලේඛණයේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ විස්තර දක්වා නොතිබුණි.

**2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**බදු ගෙවීම.**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පළාත් පාලන කොමසාරිස්වරු අමතන ලද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2009 අගෝස්තු 20 දිනැති ලිපිය අනුව ජාතිය ගොඩනැගිමේ බද්ද සඳහා වාර්තා සැපයීම කාර්තු වශයෙන් සිදු කල යුතු වුවද, සභාව විසින් 2009 ජූනි සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ජේදයට අදාලව විවිධ සේවා සැපයීම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට දනවා නොතිබුණි.

(ආ) කාර්තුවක් සඳහා වන බද්ද වාරික තුනකින් ගෙවිය යුතු වුවද 2009 ජූනි සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ජේදය සඳහා එකතු කර තිබූ රු. 212,582 ක බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂනය නොකර විගණිත දින වන 2010 අගෝස්තු 13 දින වන විටද පොදු තැන්පත් ගිණුමේ රදවාගෙන තිබුණි.

(ඇ) 2011 ජුලි 27 දිනැති දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ ලිපියට අනුව 2005 III වන කාර්තුවේ සහ 2007 මුල් කාර්තු තුනේ එකතු කල අගය මත බදු නොගෙවීම නිසා සභාවට රු. 1,192,760 ක දඩ මුදලක ගෙවන ලෙස නියම කර තිබුණි. නමුත් සභාව විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**2.9 කාර්ය සාධනය**

**2.9.1 ඩෙංගු මර්ධන විශේෂ ව්‍යාපාතිය**

(අ) සභාව විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ඩෙංගු මර්ධන ව්‍යාපෘතිය මගින් මීරිහාන සෞඛ්‍ය පරිපාලන කොට්ඨාශය ආවරණය වී නොතිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2009 මැයි 19 දිනැති අංක (බ.ප) LGD/03/01/09/01 දරණ ලිපිය අනුව මාසික හා ත්‍රෛයි මාසික වාර්තා 2010 ඔක්තෝබර් මාසයෙන් පසු සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

## 2.9.2 ගොඩිගමුව සුසාන භූමියේ අවමංගල උත්සව සේවාවන්, අවමංගල ශාලාවක් පවත්වාගෙන යාම

**(අ)** පළාත් පාලන කොමසාරිස්ගේ 2010 පෙබරවාරි 16 දිනැති අංක LGD/06/05/U 13 ලිපිය අනුව, නගර සභා ආඥා පනතේ 153 වගන්තිය පරිදි හා ව්‍යාපෘති වාර්තාව අනුව ව්‍යාපෘතිය වෙනුවෙන් සකස කල යුතු අතුරු ව්‍යවස්ථාවක් සකස් කර නොතිබුණි.

**(ආ)** නගර සභා ආඥා පනතේ 38 වගන්තියේ සඳහන් කරුණු ඇතුලත් ගිවිසුමක් සභාපති විසින් සේවා සැපයුම්කරු සමඟ ඇති කර ගෙන නොතිබුණි.

**(ඇ)** 2010 ඔක්තෝබර් 18 දිනැති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශ අනුව සැපයුම්කරු ඉදිරිපත් කරනු ලබන අවමංගල්‍ය සේවා වෙනුවෙන් වියදම් හා ලාභාංශ ලෙස සේවා සැපයුම්කරුගේ මිලෙන් 10%ක් අය කල යුතු බවට සභාව තීරණය කර තිබුණි. 2010 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා වන කාලය තුලදී සේවා සැපයුම්කරු විසින් පුද්ගලයන් 47 ක් වෙනුවෙන් අවමංගල සේවා සපයා රු. 166,800 ක මුදලක් සභාවට ගෙවා තිබුණි. එම ආදායම් මුදලෙහි නිරවද්‍යතාවය පිළිබඳව සභාව විසින් පසු විපරම් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

## 2.10 කොන්ත්‍රාත් පරිපාලනය

**ඉදිකිරීම්**

**(අ) ප්‍රගතිපුර වොලිබෝල් ක්‍රීඩා පිටිය වටා දැල් වැටක් යෙදීම සහ විදුලිය ලබා ගැනීම**

(i) ඉහත කර්මාන්තය ඉටු කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2009 නොවැම්බර් 27 දින රු.573,780 ක ප්‍රතිෂ්ඨාවකට ප්‍රගතිපුර 524A ග්‍රාම සංවර්ධන සමිතිය වෙත පවරා තිබුණි.මෙම කර්මාන්තයේ ගෙවීම් වාර්තාවලට අනුව අංක 10 අයිතමය යටතේ 2" x 2" ප්‍රමාණයේ ගේජ් 10 ව.අ 3200 ප්‍රමාණයක දැල් සපයා කණු අතර ඇද පයිප්ප කණු වලට පට්ටම් වෙල්ඩින් කර බෝල්ට් ඇණ යෙදීමේ කාර්යය සඳහා කොන්ත්‍රාත්කරුට රු.288,000 ක් ගෙවා තිබුණද, 2011 ජනවාරි 12 දින භෞතික පරීක්ෂාවේදී වර්ග අඩි 2,868.75 ක ප්‍රමාණයක පමණක් දැල්

සපයා සවිකර තිබූ බව අනාවරණය වූයෙන් , රු. 29,813 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) රු 28,800 ක් වැය කර වයර් සපයා සවිකර, රු.6,500 ක Flash ලාම්පු දෙකක් ද සවිකර තිබූ නමුදු ක්‍රීඩා පිටියට විදුලි සැපයුම ලබා ගෙන නොතිබුණි.

**(ආ) මහරගම දුම්රිය මාවත විවේකාරාම විහාරස්ථානයට ඇතුල්වන මාර්ගයේ මැද කොටස කොන්ක්‍රීට් කිරීම**

ඉහත කර්මාන්තය ඉටු කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2010 නොවැම්බර් 09 දින රු.187,500 ක ප්‍රතිෂ්ඨාවකට පමුණුව ග්‍රාමීය සංවර්ධන බලකාය වෙත පිරිනමා තිබුණ අතර, 2011 ජනවාර් 12 වන දින භෞතික පරීක්ෂාවේදී මාර්ගයේ දිග අඩි 52 ක කොටසක කොන්ක්‍රීට් තට්ටුව සේ: $^3/_4$ " ගල් මතු වී තිබූ බව අනාවරණය විය.

**(ඇ) සභාවට අයත් රුක්මල්ගම පැරණි ගොඩනැගිල්ල දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ලෙස නවීකරණය කිරීම**

ගොඩනැගිල්ල අයත් ඉඩම තුල රෙඩිෆාම් පැල 08 ක් සපයා සිටුවීම වෙනුවෙන් එක් පැලයකට රු. 6,750 බැගින් රු. 54,000 ක මුදලක් අදාල කොන්ත්‍රාත්කරු වන රුක්මලේ බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත 2010 මැයි 14 දින ගෙවා තිබුණද, මෙම පැල වර්ගයම ගොඩිගමුව අවමංගල ශාලාව වටා සිටුවීම සඳහා පැලයකට රු.5,200 බැගින් ගොඩිගමුව ග්‍රාම සංවර්ධන බලකාය වෙත 2010 ඔක්තෝම්බර් 15 දින ගෙවා තිබුණෙන් මෙම සැපයුම සඳහා රු.12,400 ක වැඩිපුර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

## 2.11 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය